**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ("ආයතනය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි අංක 13 සහ 26 ඡේදවලට අනුව, ආයතනය විසින් මේ දක්වා ප්‍රයෝජනයට ගන්නා කොළඹ සහ අනුරාධපුර ඉඩම් දෙකක සාධාරණ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, එම ඉඩම්වල අයිතිය ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වන විට මූල්‍ය ප්‍රකාශනවල ඉහත ඉඩම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | අයිතිය නොමැතිව ඉඩම් වත්කම් ලෙස පිළිගත නොහැක. | එම ඉඩම්වල අයිතිය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට පවරාගෙන ඉඩම්වල වටිනාකම කඩිනමින් ගිණුම් පොත්වල සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 ඡේදයට අනුව, 2014 වර්ෂයේදී වැරදි ලෙස පද්ධතියට ඇතුළත් වී තිබූ ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද රු.1,452,439 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිවැරදි කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරනු ඇත | දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 දී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා රු.3,771,216 ක මුදලක් වැය කර තිබුණු අතර, ආයතනයේ අවශ්‍යතා සමඟ නොගැළපීම හේතුවෙන් එය අත්හැර දමා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී ද එම වටිනාකම නොනිමි වැඩ ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සටහන් කර ඇත. | ගිණුම්වල සුදුසු ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට අනුව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු.37,394,931 ක් වුවත්, ස්වාධීන ගණනය කිරීම අනුව එය රු.33,197,432 ක් වූයෙන් වෙනස රු.4,197,499 ක් විය. | එකඟ විය. 2024 වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි සංඛ්‍යා නැවත ප්‍රකාශිත යටතේ පෙන්වනු ලැබේ. | ඒ අනුව නිවැරදි කිරීම කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ විගණනයට ලබා දී ඇති උපලේඛනයේ සඳහන් උපචිත වියදම්වල රු.4,547,592 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, උපචිත වියදම්වල වසර 5 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවූ මුළු ශේෂය රු.3,087,855 ක් විය . | එකඟ වන අතර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් නිවැරදි කිරීමට සහ උපචිත වියදම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ උපචිත වියදම් රු.19,241,195 ක් හඳුනාගෙන නොතිබුණි. එහිදී, අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සටහන් කර ඇති අතර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්වල උපචිත වියදම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය . |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති රු.7,012,825 ක් වූ භෞතිකව සත්‍යාපනය කරන ලද තොගය, තොග වාර්තාවල ශේෂයන් සමඟ සංසන්දනය කිරීමට සහ විචලතා හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනාගතයේදී නිවැරදි ක්‍රියාවලිය අනුගමනය කිරීමට සැලසුම් කර ඇත. | නියමිත වේලාවට භෞතික තොගය සමඟ සැසඳීම් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2022 දෙසැම්බර් 31 දිනට භෞතික තොග සත්‍යාපනය කිරීමේදී තොග අයිතම 238 ක පිරිවැය හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව ආයතනයේ ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. තව ද 2023 ජනවාරි 01 දිනට ඒවා ආරම්භක ශේෂයට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වූ අතර තෙවන පාර්ශවය විසින් සම්පූර්ණ කරන ලද ස්ථාවර වත්කම් සත්‍යාපන ක්‍රියාවලියෙන් පසුව ගැටළුව නිවැරදි කරනු ලැබේ. | අනාගතයේදී තොග අගය කිරීම වගකිවයුතු නිලධාරියෙකු විසින් නිවැරදිව සිදු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| **(අ)** | **ලැබිය යුතු දෑ** | | | | | |
| i. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් | 4,248,978 | 6,512,810 | 2,263,832 | විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය අනුව, මෙම කාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සමඟ සාකච්ඡා කරන ලදී. මැතකදී නිවැරදි කිරීම සිදු වෙමින් පවතී. | ශේෂයන් වරින් වර සංසන්දනය කළ යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| ii. | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් | 5,728,382 | 398,575 | 5,329,807 | | |
| iii. | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයෙන් | 615,018 | 44,405 | 570,613 | | |
| iv. | සංචාරක සංවර්ධන බද්ද සහ අපගමන බද්ද | 233,982,276 | 287,637,153 | 53,654,877 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය තහවුරු කිරීම් අනුව ප්‍රකාශය සඳහා සංචාරක සංවර්ධන බද්ද සහ අපගමන බද්ද හඳුනා ගෙන ඇත. | |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| උතුරු නැගෙනහිර පළාත් සංචාරක සහයෝගී ව්‍යාපෘතියට අදාල තැන්පතුව | 1,944,465 | ලදුපත් සහ වෙනත් මූලාශ්‍ර ලේඛන | ලබා දී නොමැත. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට හෝ නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ඉතිරිය කපා හැරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු දේ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක පොලිස් ඒකකයෙන් 2014 වර්ෂයේදී ලැබිය යුතු රු.3,192,000 ක කුලී ආදායම ආදායමක් ලෙස හඳුනාගෙන ණය ගැතියන්ගේ ලැබිය යුතු මුදල් යටතේ දක්වා තිබුණද, මෙම මුදල අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් මතු වී තිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා වූ අගය හායනය වීම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. තවද, 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ඒකකය විසින් පරිශ්‍රය භාවිතා කරන නමුත් කිසිදු කුලී මුදලක් අය කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශයට අනුව, 2013-2014 සඳහා හිඟ කුලී සහ 2015-2022 සඳහා වියදම් අයකර ගැනීම සඳහා ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත යවා ඇත. | ගිණුම්වල සුදුසු ගැලපීම් සිදු කළ යුතු අතර අදාළ අයිතම ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයෙන් අය විය යුතු රු.330,000 ක කුලී ආදායම මේ දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සමඟ පැවති සාකච්ඡාවෙන් පසු මෙම මුදල පියවීමට ඔවුන් එකඟ විය. | 2024 වර්ෂයේදී කුලී ආදායම් ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ සිට Koala ( Pvt ) Ltd වෙතින් ලැබිය යුතු රු.370,976ක ලැබිය යුතු ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේ දී පවා අය කර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේදී එම ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වසර 16 ක කාලයක් තිස්සේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.3,810,324 ක් වූ උපචිත වියදම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. | අයකිරීම් කමිටුව මගින් ලබා දෙන තීරණයෙන් පසු ක්‍රියාමාර්ගයක් ගනු ලැබේ. | 2024 වර්ෂයේදී එම ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ලොන්ඩ්‍රි ණය ගැතියන්ගෙන් රු.305,350 ක් සහ සමුද්‍රා හෝටල් ණය ගැතියන්ගෙන් රු. 25,678,878 ක ලැබිය යුතු මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. එයින් රු.25,984,228 ක මුදලක් මාස 24 කට වැඩි කාලයක් හිඟව තිබුණි. මුදල් අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයාගෙන් රු.4,068,000ක්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.5,140,571ක්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙතින් රු.3,583,010ක් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙතින් රු.5,723,382ක් ඉහත ලැබිය යුතු මුදල්වල ඇතුළත් වී තිබුණි. | දැනට අයකිරීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. ආයතන අතර දිගු කාලයක් තිස්සේ හිඟ ශේෂයන් නිරවුල් කිරීම සඳහා රැස්වීම් පවත්වමින් සිටී. | දිගුකාලීනව ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii කොටසේ 5(1) වගන්තිය. | විශ්‍රාම යාමේ දින සිට මාසයක් ඇතුළත පාරිතෝෂිත දීමනාව ගෙවිය යුතු වුවත්, 2023 වසරේ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුට ගෙවිය යුතු මුළු පාරිතෝෂිත මුදල වූ රු.2,192,482 ක් විගණිත දිනය වූ 2024 අප්‍රේල් 24 දින වන විටත් ගෙවා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විශ්‍රාම යාමේ දින සිට මාසයක් ඇතුළත පාරිතෝෂිත දීමනාව ගෙවිය යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායයන් (SOE) සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ඡේදය | සමාලෝචිත වර්ෂය අවසානයේ වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කර නොතිබූ අතර මේ දක්වා විගණකාධිපතිවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කර වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායයන් සඳහා වන යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය | ආයතනය සඳහා උපායමාර්ගික සැලැස්මක් 2020-2023 දක්වා වූ වර්ෂ හතරක කාලය සඳහා සකස් කර තිබුණු අතර අද දක්වා එය යාවත්කාලීන කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | උපායමාර්ගික සැලැස්ම යාවත්කාලීන කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 417,479,936 ක අතිරික්තයක් සහ ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.125,872,269 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.291,607,667 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අපගමන බදු ආදායම රු.210,270,982 කින් සහ සංචාරක සංවර්ධන බද්ද රු.38,098,576 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා සමුද්‍රා හෝටලයේ අලෙවිකරණ සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී නොතිබුණි. කොල්ලුපිටියේ ප්‍රධාන ස්ථානයක පිහිටි සමුද්‍රා හෝටලයේ මුහුද දර්ශනය වන කාමර 10 ක් තිබුණද එම කාමරවල පහසුකම් සහ සුවපහසුව සතුටුදායක මට්ටමක නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සමුද්‍රා හෝටලය සඳහා අලෙවිකරණ සැලැස්මක් සකස් කළ යුතු අතර කාමරවල පහසුකම් සහ සුවපහසුව වැඩිදියුණු කළ යුතුය. |
| (ආ) | සමුද්‍රා හෝටලයේ වසරකට කාමර රාත්‍රී 4,380 ක් සැපයීමට පහසුකම් තිබුණි. කෙසේ වෙතත්, එහි භාවිතා කර ඇති කාමර රාත්‍රී සංඛ්‍යාව 494 ක් පමණි, එනම් මුළු සංඛ්‍යාවෙන් සියයට 11 කි. එබැවින් සමුද්‍රා හෝටලය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කටයුතු 2023 වර්ෂයේදී නිම කරන ලදී. | හෝටලය ආර්ථිකමය හා ඵලදායී ලෙස ආදායම් උපයා ගැනීම සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ සමුද්‍රා අවන්හල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.5,841,912 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, ආයතනය විසින් සැලසුම් කළ ආකාරයට සමුද්‍රා අවන්හලේ මෙහෙයුම් කටයුතු අද දක්වාම ආරම්භ කර නොතිබුණි. | එකඟ වේ. සැලසුම්ගත ආකාරයට අවන්හලේ මෙහෙයුම් කටයුතු මේ වසරේදී ආරම්භ කෙරේ. | සැලසුම් කළ මෙහෙයුම් කටයුතු ඉක්මනින් ආරම්භ කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා හෝටල් පාසල යටතේ වූ විවිධ පාඨමාලා සඳහා ලැබී තිබුණු අයදුම්පත් සංඛ්‍යාව 11,788 ක් වූ අතර, එම අයදුම්කරුවන්ගෙන් 5,912 ක් හෝ සියයට 50 ක් පාඨමාලා සඳහා ලියාපදිංචි වී තිබුණි. මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් පන්තිකාමර සඳහා ඉඩකඩ නොමැතිකම නිසා ඇති වූ බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඉහළ ඉල්ලුමක් සපුරාලීම සඳහා විසඳුමක් | සතියේ දින සහ සති අන්ත පාඨමාලා ලෙස විවිධ ආයතන විසින් ඉල්ලා සිටින ඇතැම් පාඨමාලා අප ආයතනයේ ආචාර්යවරුන් විසින් අප ආයතනයේ පවතින ඉඩ ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් ඔවුන්ගේ ආයතන පරිශ්‍රය | නේවාසිකාගාර ඇතුළු ධාරිතා වැඩි දියුණු කිරීම සමඟ පාසලේ පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට ආයතනයේ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. තවද, ග්‍රාමීය ප්‍රදේශවල හෝටල් පාසල් ශාඛා සඳහා නවාතැන් ගත හැකි නේවාසිකාගාර පහසුකම් ස්ථාපිත කර එම පන්තිකාමර සම්පූර්ණයෙන්ම යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තුළම පවත්වනු ලැබේ. අප ආයතනය මගින් පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලා වලට අමතරව කෙටි කාලීන පාඨමාලා හඳුන්වා දෙමින් ප්‍රාදේශීය පාසල් කෙරෙහි අවධානය යොමු කරමින් එම පාසල්වලට අවශ්‍ය භෞතික සම්පත් ලබාදෙමින් අප ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරමින් සිටිමු. | |
| (ඉ) | 2008 වර්ෂයේ සිට සමුද්‍රා හෝටලයේ උපකරණවල හානි පියවා ගැනීම සඳහා සේවා ගාස්තු මත සියයට 2 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2018 වර්ෂය අවසානයේ රු.546,689 ක් වූ එම ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේ දී පවා නොවෙනස්ව පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | සමුද්‍රා හෝටලයේ සේවා ගාස්තු මත ලබා දී ඇති මෙම ප්‍රතිපාදන උපකරණවල හානි ආවරණය කිරීම සඳහා යොදා ගත යුතුය. |
| (ඊ) | සමුද්‍රා ලොන්ඩ්‍රියේ විකුණුම් පිරිවැය ඉකුත් වර්ෂයේ ලොන්ඩ්‍රි ආදායමට සාපේක්ෂව සියයට 12.76 කින් ඉහළ ගොස් තිබුණි. එහි දී, ලොන්ඩ්‍රියේ දළ ලාභ අනුපාතය ද සියයට 18.76 කින් අඩු වී තිබුණි. ඍජු පිරිවැය වැඩිවීමට එරෙහිව ලොන්ඩ්‍රි ගාස්තු සංශෝධනය නොකිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, ඉකුත් වර්ෂයේදී රු.මිලියන 1.9 ක අතිරික්තයට ප්‍රතිවිරුද්ධව සමාලෝචිත වර්ෂයේ දී රු.459,607 ක ඌනතාවයක් වාර්තා කර තිබූ අතර, එයට ප්‍රධාන වශයෙන් පිරිවැය අවම කිරීම සඳහා සලකා නොබැලීම සහ ලොන්ඩ්‍රි ආදායම සමාලෝචනය නොකිරීම හේතු වී තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන අතර ගාස්තු සංශෝධනය කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර 2024 මැයි සිට ක්‍රියාත්මක කර ඇත. | ගාස්තු සංශෝධනය කිරීමට සහ පිරිවැය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | 2023 පෙබරවාරි සිට නොවැම්බර් දක්වා බැංකු ගිණුම් අංක 0007120156 වෙත ලැබුණු එකතුව රු.1,842,398 ක් වූ හඳුනා නොගත් ඍජු තැන්පතු සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම හඳුනාගෙන මුදල් පොතට ඇතුළත් කර නොතිබුණි. | එකඟ වේ. | හඳුනා නොගත් ඍජු තැන්පතු හැකි ඉක්මනින් හඳුනාගත යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමුද්‍රා හෝටලයේ අනුමත සේවක සංඛ්‍යාව 27 ක් වුවද මේ වන විට සේවක සංඛ්‍යාව 19 ක් වී තිබුණි. එබැවින් අද දක්වා ඇති පුරප්පාඩු 08 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | 2023 ඔක්තෝබර් 26 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් අනුමැතිය අනුව ස්ථිර නිලධාරියෙකු බඳවා නොගෙන බඳවා ගැනීමේ ක්‍රමවේදයට පටහැනිව, සමුද්‍රා හෝටලයේ මෙහෙයුම් කළමනාකරණය කිරීමට බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස නිලධාරියෙකු පත් කර තිබූ අතර, 2023 නොවැම්බර්, දෙසැම්බර් සහ 2024 ජනවාරි මාස සඳහා පැයකට රු.1,000ක් ද ගෙවා තිබේ. 2024 ජනවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය පැයකට රු.1,800 ක් දක්වා ඉහළ නංවා තිබේ ඒ අනුව, 2023 පෙබරවාරි මාසයට රු.373,816 ක් සහ 2023 මාර්තු මාසයට රු.300,000 ක් ගෙවා තිබුණි. | එකඟ වේ. ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ස්ථිර නිලධාරියකු බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමක් සිදු නොකර ලොන්ඩ්‍රිය අධීක්ෂණය සහ දේශන පැවැත්වීම සඳහා බාහිර කථිකාචාර්ය කාණ්ඩය යටතේ බඳවාගත් නිලධාරියාට පැයකට රු.500 බැගින් සහ දිනකට උපරිම පැය 6 බැගින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ මෙම පැයක ගාස්තුව රු.3,100 ක් හා උපරිම මාසික සීමාව රු.300,000 ක් දක්වා වැඩි කර තිබුණු අතර, එහිදී ඔහුට 2024 පෙබරවාරි සහ මාර්තු මාස සඳහා රු.300,000 බැගින් ගෙවා තිබුණි. . | එකඟ වේ. ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ස්ථිර නිලධාරියකු බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3. 3 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් භාරදී තිබුණු රු.860,000 ක් වටිනා වාහනය සමාලෝචිත වර්ෂය අවසන් දිනට විගණනයේදී භෞතිකව තහවුරු කර ගැනීමට නොහැකි විය. | අදහස් දක්වා නොතිබුණි. | අදාළ ලියකියවිලි ඉක්මනින් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |